





ශාමිලා අමන්දිට කලාගාරයට ඇතුල්වීමට ඉඩ දෙමින් දොර වෙතින් මෑත් වූවා ය. වාඩිවන්න යයි කියන්නට අවශ්‍ය වූ නමුත් කතා කරන්නට නොහැකි ලෙසින් මුව ගොළුවී ඇති බවක් ඇයට දැනෙයි. තේරුම් ගත නොහැකි යම් අමුත්තක් පෙනුණද ආගන්තුක ගැහැණිය ගේ ආකර්ශණීය රූපකාය ඇගේ සිතේ ඇති කළේ ඊර්ෂ්‍යාවකි. ඇගේ දීප්තියකින් තොර ආකර්ශනීය නිල් දෑසින් සිය දෑස් ගලවා ගන්නට ශාමිලා උත්සාහ කළා ය. මේ දෑස ඒ ආකාරයටම විශ්වජිත් අතින් කැන්වසයක් මත ජීවමානව සිත්තම් වී තිබුණ ආකාරය ශාමිලාට අමතක නැත.

"මම අමන්දි.." විස්මයෙන් මෙන් බලා සිටිනා තරුණිය යමක් කියනු ඇතැයි යන අපේක්ෂාවෙන් මොහොතක් බලා සිටි අමන්දි දෙවන වතාවටත් තමා හඳුන්වා දුන්නා ය. ශාමිලා අපහසුවෙන් සිනාසුණා ය. වඩාත් නිවැරදිව කියනවා නම් සිනාවක් මවා ගත්තා ය.

"මම ශාමිලා.." ඇය කීවා ය. ".. සර්ගෙ ස්ටුඩන්ට් කෙනෙක්.." එසේ කියන්නට සිතුණද ඇය ඒ වචන සඟවා ගත්තා ය. ශිෂ්‍යාවක ලෙස හඳුන්වාදීමෙන් ඔහු සහ තමා අතර දුරස්ත බවක් ඇති වෙයි. එවැනි හැඟීමක් අමන්දිට නොදිය යුතු යයි ඒ මොහොතට ශාමිලා සිතුවා ය.

අමන්දි ශාමිලා පසුකර කලාගාරයට ඇතුල් වූවා ය. තැන තැන ගොඩ ගසා ඇති පොත් පත් සඟරා ත් විවිධ සිතුවම් අඳින ලද කැන්වස් රාමුත් ගිය වතාවේ ආ විටත් තිබූ ආකාරයෙන්ම තවමත් තිබීම අමන්දිගේ පුදුමයට හේතු නොවී ය. විශ්ව යනු දිය රළකුදු නොනඟන නිසල විලක් වන් මිනිසකු බව අමන්දි පසක් කරගෙන සිටියා ය. ඒ චරිතය තුළ සැඟව ගත් ගුප්ත බව සේම මතුපිටින් ඔහු ප්‍රදර්ශනය කරන අපිළිවෙල ද අමන්දි හඳුනාගෙන සිටියා ය. මෙතරම් කෙටි කලකදී මිනිසකු පිළිබඳ මෙතරම් අවබෝධයක් ලබා ගත හැකි වන්නේ කෙසේ දැයි ඇය නොදත්තා ය. සංසාරගත පුරුද්දක්ට මෙන් මේ සියල්ල තමාට දැනෙන්නේ යයි අමන්දි සිතුවා ය.

"මං අස් කර කර හිටියෙ.." අමන්දි පොත් ගොඩ දෙස බලා සිටිනු දුටු ශාමිලා කීවා ය. අමන්දි ආපසු හැරී ශාමිලා දෙස බැලුවා ය.

"මං ගිය සැරේ එනකොටත් මේ වගේ පොත් ගොඩවල් තැන තැන තිබුණා.." අමන්දි කීවා ය. ශාමිලා කල්පනාවට වැටුණා ය. මෙයට පෙර මෙහිදී ඇය දැක ඇති බවක් ශාමිලාට මතක නැත.

"ඔයා මෙයිට කලින් මෙහෙ ඇවිත් තියෙනවද..?"

අමන්දි අපහසුවෙන් සිනාසුණා ය. ඒ ආ ගමනේ අම්හිරියාව නැවත සිහිපත් කළ යුතු නැත.

"මිස් වාඩිවෙලා ඉන්න.." ශාමිලා යමක් සිහිපත් වූවාක් මෙන් කීවා ය. "..මං යන්න ඕනෙ දැන්.." කඩිමුඩියේ සිය ගමන් මල්ල කර ලා ගත් ඇය අමන්දි දෙස බැලුවාය. විශ්ව කොයි මොහොතේ හෝ කලාගාරයට පැමිණෙන බව ශාමිලා දැන සිටියා ය. ඔහු එන්නට පෙර ඔහුට මුහුණ නොදී පිටව යා යුතු යයි ඇගේ සිත කීවේ ය. විශ්ව හා අමන්දි ඉදිරියේ පෙනී සිටීමේ අපහසුව දරා ගත නොහැකි තරම් වනු ඇතැයි ඇයට සිතුණි. එය මහත්ම වේදනාවක් වනු ඇත . එය විඳ ගන්නවාට වඩා මෙතැනින් පලා යාම මැනැවැයි ඇය තීරණය කර තිබුණි.

"ඇයි යන්නෙ..? සර් මුණගැහෙන්න ඉන්නැද්ද..?" අමන්දි ඇසුවා ය.

"නෑ.. මං දැන් යන්න ඕනෙ.. මං හිතුවෙ නෑ සර් මේ තරම් පරක්කු වෙයි කියලා.." ශාමිලා කීවා ය. තවත් වතාවක් අමන්දි දෙස බලා ඉඟියෙන් අවසර ගත් ශාමිලා ඉක්මන් ගමණින් කලාගාරයෙන් පිටවූවා ය. සිහින් කඳුලක තෙතමනය ඇගේ ඇස් මත තැවරුණි.

කලාගාරයෙන් පිටව මහ මගට අවතීර්ණ වූයේ ශාමිලා ගේ ස්කූටරය බව විශ්වජිත් ඈත තියාම හඳුනා ගත්තේ ය. ඇය එන්නට ඇත්තේ පාඩම් ගන්නට ය. එහෙත් ඇය තමා හමුවන්නට නොරැඳී නික්ම යාම අසාමාන්‍ය ය.

කලාගාරය මිදුලේ නවතා ඇත්තේ නුපුරුදු මෝටර් රථයකි. එය අමන්දි ගේ විය යුතු ය. ඇය හමුවන්නට පොරොන්දු වූ වේලාවට වඩා පැය බාගයක් තමා ප්‍රමාද බව විශ්ව දනියි. පමාව සිදුවූයේ ඔහුගේ වරදකින් නොවේ. නගර ශාලාව අසළ හදිසි අනතුරකට ලක්ව තිබූ වාහන දෙකක් නිසා පාර අවහිර වීමෙන් ය.

අමන්දි දිග සෝපාවේ කෙළවරක වාඩි වී සිටිනු විශ්ව දොර අසළදීම දුටුවේ ය. දිගඇරගත් කලා සඟරාවකට නෙත් යොමා සිටින ඇය තමා නොදුටුව බව ඔහු දුටුවේ ය. ඇගේ නළල් තලය මත ඩා බිඳු නැගී ඇති ආකාරයත් නෙත් වේදනාවෙන් කුඩා වී තිබෙන ආකාරයත් ඔහු වහා නිරීක්ෂණය කළේ ය. ඈ ඉදිරියේ දණින් සිටගත් ඔහු ඇග් මුහුණට එබී බැලුවේ ය. ඈ ඔහු දෙස බලා ආයාසයෙන් සිනාසුණා ය. ඇගේ ඇස් කඳුළින් පිරී තිබෙනු ඔහු දුටුවේ ය.

"ඔයාට සනීප නැහැ නේද..?" ඔහු ඇසුවේ ඇගේ නළල මත වූ ඩා බිඳු දකුණතින් පිස දමන අතර ය. ".. නළල අයිස් කැටයක් වගේ සීතල වෙලා.."

ඇය පිළිතුරක් නොදුන්නා ය.

"ඔයාට සනීප නැහැ..?" ඔහු නැවත ඇසුවේ සිය දකුණතින් ඇගේ නළල මත මතුව තිබූ ඩා බිඳු පිස දමන අතර ය.

"මට පොඩ්ඩක් කලන්තයක් වගේ ආවා.." ඇගේ සිහින් දුබල කටහඬ ඔහුට ඇසුණි. ".. පොඩ්ඩක් මෙහෙම ඉන්නකොට ඒක හරි යයි.."

"අපි යමු ඩොක්ටර් කෙනෙක් ළඟට.." ඔහු ඈ කී දේ නෑසුණා සේ කීවේ ය.

"ඕනෙ නැහැ විශ්ව.. මට මෙයිට කළිනුත් මෙහෙම වෙලා තියෙනවා.. පොඩ්ඩක් රෙස්ට් කළාම හරි.. බයවෙන්න එපා.." ඇය නැවත සිනාසෙන්නට උත්සාහ කළා ය.

ඔහු නැගිට ගොස් මේසය මත වූ ගුරුලේත්තුවෙන් වතුර වීදුරුවක් පිරෙව්වේ ය. එය අමන්දිගේ අතට දෙන්නට නොවෙහෙසී ඇගේ මුවට ළං කළා ය. ඇය මහත් පිපාසයකින් මෙන් වතුර උගුරු කීපයක් බීවා ය. දෑස් පියාගෙන සිටියා ය. විශ්ව ඈ අසළින් සෝපාව මත ඉඳගත්තේ ය. විනාඩි කීපයකට පසු ඇය හිස ඔසවා ඔහුගේ මුහුණ බැලුවා ය.

"දැන් හරි.." ඇය සිනාසුණා ය. ".. අපි පාඩම පටන් ගනිමුද සර්..?"

0000000000000

"හවුසින් මිනිස්ට්‍රි එකට දාපු අපේ ප්‍රොජෙක්ට් ප්‍රොපෝසල් එක රිජෙක්ට් වෙලා.." ගුණසේකර නිමන්ත ඉදිරියේ වූ අසුණේ වාඩි වූයේ ලිපි ගොණුව මේසය මතට අත හරිමින් ය. සිය ප්‍රධානියා ගේ කටහඬෙහි සැඟව ගත් කෝපය නිමන්තට හොඳහැටි දැනෙයි.

ව්‍යාපෘති යෝජනාව සකස් කළේ නිමන්ත ය. එය ප්‍රතික්ෂෙප වූවා නම් එහි වරද ඔහුගේ ය. හිතේ එකලාසයකින් තොරව සකස් කළ වාර්තාව අසාර්ථක වීම එක අතකින් පුදුමයක් නොවේ.

"අපේ එස්ටිමේට්ස් ඔක්කොම වැරදියි කියල මිනිස්ටර් අද මට පුද්ගලිකවම කිව්වා... ඔයා දන්නවනෙ අපි මේක ගැන කොයි තරම් බලාපොරොත්තු තියාගෙන හිටියද කියල .."

ගුණසේකර කියන්නේ සැබෑවක් බව නිමන්ත දනියි. පසුගිය කාලයේම ආර්ථික අතින් වාසි ගෙන දෙන ව්‍යාපෘති කීපයක්ම ආයතනයෙන් ගිළිහී ගියේ නොසිතූ ආකාරයට ය. එබැවින් නිවාස අමාත්‍යාංශයේ ව්‍යාපෘතිය කෙසේ හෝ ලබා ගැනීමේ අවශ්‍යතාව ආයතනය පුරා සාකච්ඡා වෙමින් තිබුණි. අනෙක් තරගකාරී ඉදිකිරීම් සමාගම් අභිබවා යන ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කිරීමේ වගකීම තමා පිටට පැටවුණ මොහොතේ එය ප්‍රතික්ෂෙප කිරීමේ හැකියාවක් නිමන්තට නොවී ය. එය වෙනෙකෙකුට නොපැවරීමෙන් තමා ආයතනයට කළේ ආසාධාරණයක් යයි ඔහුට සිතෙයි.

"සොරි මිස්ට ගුණසේකර.." නිමන්ත මේස වීදුරුව දෙස බලාගත්වන ම කීවේ ය. ".. මම ආයෙම ඒක හදන්නම්.."

"ඒක හරියන්නෙ නැහැ නිමන්ත ... අපට රීසබ්මිට් කරන්න ඉඩක් නැහැ... ප්‍රොජෙක්ට් එක යුනිටි කන්ස්ට්‍රක්ෂන් එකට දෙන්ඩ එයාල තීරණය කළා.." ගුණසේකර කීවේ පුටුවෙන් නැගිටින අතර ය. ".. මං දන්නව නිමන්ත ඉන්නෙ ලොකු ප්‍රශ්නයක කියල .. ඒත් මේ ආයතනය වැටුණොත් ඔයාගෙ විතරක් නෙවෙයි තවත් මිනිස්සු සිය ගාණකගෙ රස්සාවල් නැති වෙලා යනවා කියන එක අමතක කරන්න එපා.. තමන්ට හරි හැටි ඒක කරන්න මානසිකත්වයක් නොතිබුණා නම් මට කියන්න තිබුණා.. එහෙම නම් මං ඒකට පිළියමක් යොදනවා.." ඔහු දොර අසළ සිට නිමන්ත දෙස බලා කීවේ ය.

ගුණසේකර පිටව යන තෙක්ම නිමන්ත නිහඬතාව රැක්කේ ය. ආයතනයක සුළු සේවකයකු සේ නිදහසට කරුණු කියමින් ප්‍රධානියා පසු පස යාමේ තේරුමක් නැත.

අවුල් වෙමින් තිබෙන ජීවිතය නිසි ලෙසින් කළමණාකරණය කර ගත යුතු බව දන්නා නමුත් ඒ සඳහා ශක්තියක් තමන්ට නැත්තා සේ නිමන්තට දැනෙයි. අමන්දි රෝගී වීමටත් වඩා ඔහු සිත සසළ කළේ ඇය ක්‍රමයෙන් තමන්ගෙන් ඈත්ව යාමයි.

අමන්දි සියලු ශාරීරික දුබලතා අමතක කර දැමුවාක් මෙන් උදෑසනින් නැගිටියි. රාත්‍රිය පුරා අඩනින්දෙන් මෙන් ඇගේ කෙඳිරිය අසා සිටිනා